# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1887/13 – 2014 නොවැම්බර් 04 වැනි අඟහරුවාදා – 2014.11.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, තිරිවානකැටිය - අගලවත්ත මාර්ගයේ අංක 29/8 පාලම නැවත ඉදි කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුකුළු කෝරළය මැද පත්තුව සුළු කොට්ඨාසයේ, වේවැල්කඳුර (අ.ග.සි. 245) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංකඃ R/SS/NVT/2013/516 හා 2014.06.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'සී' වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0215 ක් පමණ වූ ඇල්ලගාව කුඹුර නමැති ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'සී' – ඇල්ලගාව කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0215

උතුරට සහ නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට සහ බටහිරට: පාර (මා.සං.අ.).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය .

යොමු අංකය: 4-3/5/2013/එච්ඩබ්ලිව්/525.
2014 සැප්තැම්බර් මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
1200/6, 'මිහිකත මැඳුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 516


1A – G20535 – 25 (2014/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.